# මෑණිවරුනි ඔබ අමරණීයයි !

මාලනී ජයසිංහ හා රමණී ලියනාරච්චි යනු බහු සංස්කෘතික රටක් වන ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර ශ්‍රී ලාංකීය කලා කෙත, සිංහල සංස්කෘතිය අස්වැද්දූ දැවැන්ත මුදුන් මුල් දෙකක් ලෙස අපි දනිමු. අද දවස වන විට එම මුදුන් මුල් මෙනුවරින් දෙදරා ගොස් හමාරය. එය මෙනුවර බිහිවන අනෙක් කලාකරුවන්ට කිව නොහැකි තරම් පාඩුවකි. පුරා වසර පහකට පෙර මෙල්බන් නුවරට ආගමනය කල අපි ඒ අත්දැකීම විඳ ඇත්තෙමු. මේ දැවැන්ත කාන්තා චරිත දෙක පිළිබඳ යමක් සටහන් කිරීම අප දෙදෙනාගේ යුතුකමක් සහ වගකීමක් ලෙස සලකා මේ සටහන ලියා තබමු.

වසර 2003 අප්‍රේල් මස දිනෙක 'බ්‍රෙන්ට්වුඩ්' සිංහල භාෂා පාසලේ දරු දැරියන්ගේ සිංහල අවුරුදු සැමරුම් උළෙලට ඔවුන් විසින් සූදානම් කරගත් නර්තන අංගයක අඩුපාඩු සකසා එහි ප්‍රසාංගික මට්ටම උසස් කර දීමට අපගේ ප්‍රවීන නාට්‍යවේදී ජයශ්‍රී චන්ද්‍රජිත් මහතාගේ ඉල්ලීමක් පරිදි එතුමාගේ නිවසට අප ගොඩවැදුනු දිනයේ, එම සිංහල භාෂා පාසැලේ ආචාර්යවරියක හා ඔහුගේ ඥාති සහෝදරියක ලෙස රමණී ලියනාරච්චි මෑණියන්ට අපි එදා ඇඳින ගතිමු. එදින අප දෙදෙනා කවුරුන්දැයි හඳුනා ගත් එතුමිය, ශ්‍රී ලාංකීය සම්ප්‍රදායික නර්තන කලාවේ අක්මුල් නිසිපරිදි ශාස්ත්‍රානුකූලව මේ රටෙහි ඉපිද හැදුනු වැඩුනු දරුවනට දායාද කිරීම සඳහා, එදා සිට අද දක්වා වසර 7 ක් පුරාවට අපගේ නර්තන පාඨමාලා පවත්වා ගෙන යන ඩැංඩිනොංග් කලාගාරයේ ඃබටැබදබට ̋රඑ සැබඑරු* දොර පළමු වතාවට විවර කර දුන්නාය. නර්තන කලාව අපගේ ජීවිතයේම කොටසක් වන්නාසේම, මේ විදේශ රට තුල එම කලාව අස්වද්දන්නට අපට අතදුන් රමණී ලියනාරච්චි මෑණියන් අප දෙදෙනාට මෙන්ම අපගේ ,රංගන - උදුම්බරා නර්තන කණ්ඩායමේ, සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවනට සදා අමරණීය වන්නීය. එලෙසම ඩක්‍ෂ විභාගයේදී සිංහල භාෂාව හදාරන සහ හැදෑරූ සියළුම සිසුනට ද රමණී ලියනාරච්චි නාමය අමරණීය බව අපගේ විශ්වාසයයි.

2003 වසරේ පෙබරවාරි මස පශ්චාත් උපාධි අපේක්ෂකයන් ලෙස මෙල්බන් නුවරට පැමිණීමත් සමගම නර්තන ශිල්පීන් යුවලක් වූ අපි, කලාත්මක සුවඳ මේ රට තුල සෙවීමට උත්සුක වීමු. මේ රට තුල ජීවත්වන ප්‍රවීන ශ්‍රී ලාංකීය කලාකරුවන්, කලා සංවිධාන, අපගේ ලාංකීය උරුමය මෙරට ස්ථාපිත කිරීමට වෙර දරන පුද්ගලයන් පිළිබඳ විමසිලිමත් වීමු. එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රථමයෙන්ම ඇමතීමට අප අතට පත්වූ දුරකථන අංකය මාලිනී ජයසිංහ මෑණියන්ගේ විය. එදා කථා බහ තුලින් එවකට මෙරටේ විසූ ශ්‍රී ලංකාවේ සුප්‍රකට නර්තන ශිල්පිනියක් වන බේමා මහත්මිය සමග නර්තන කලාව පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම, ශ්‍රී ලාංකීය ශාස්ත්‍රීය නර්තන කලාව මෙරට දරුවනට දායාද කරමින් වසර 7 ක් පුරා විශාල සිසු පරපුරක් බිහි කිරීමට අඩිතාලමක් විය. එදා සිට ඇය අප අතරින් සමුගන්නා තුරුම සත්වසරක් පුරා ඇය සමග සම්බන්ධ වී බොහෝ කලා කටයුතු වලට ඉතා සුහදශීලීව එක් වුනෙමු. සමහර අවස්ථාවල අපගේ විෂය සම්බන්ධ යම් යම් අඩුපාඩුකම් ඒ වැඩසටහන් තුල අප පෙන්වා දුන් විට ඇය ඒවා ඉතා නිහතමානීව පිළිගත්තේ, ඒ ඒ විෂය ක්ෂේත්‍රය තුල දැන උගත් පුද්ගලයා තමාට වඩා ලාබාල වුවත් එයට ඇහුම්කන්දීමේ උතුම් ගුණාංගයද අප සමාජයට කියා දෙමිනි. එබැවින් ඇයත් අප හදවත් තුල සදා අමරණීය චරිතයක් වූවාය. අප මව් රටේ උරුමයෙන් මෙල්බන් පුරවරයට පැමිණෙන කලාව පිළිබඳ සංවේදී මිනිසුනට, මාලනී ජයසිංහ නම් වූ ඇය මහගු තෝතැන්නක් වූවාය.

පසුගිය කාල පරිච්ඡේදය තුල අපගේ අත්දැකීම අනුව ලංකාවේ සිට මෙරටට සංක්‍රමණය වන කලාවට සංවේදී මිනිසුනට තම හිතවතුන්ගෙන් අවවාද අනුශාසනා ලැබෙන්නේ මාලනී ජයසිංහ නම් වූ මේ සුවිශේෂී මාතාව අමතන ලෙසටය. ඒ අන් කිසිවක් නිසා නොව, එදා මෙදා තුර ඇය මෙල්බන් නුවර ශ්‍රී ලාංකීය කලාව සුරැකීම සඳහා කරන ලද අපූරු මෙහෙවර නිසාමය. අප මේ රටට පැමිණෙන විට අපේ කලාංග පිළිබඳ සුවඳ මේ රට තුල පතුරුවා තිබුණේ ඇය වැන්නවුන්ගේ දහඩිය මහන්සිය විසිනි. මින් ඉදිරියටත් මෙරටට පැමිණෙන්නවුනට ඒ මාර්ගය පෙන්වීමේ මාර්ගෝපදේශිකාව අද අප අතරින් සමුගෙන ගොසිනි. එම අඩුව පිරවීමට සුදුස්සකු සිටිනවාදැයි යන සැකය අප හදවත් තුල රාව ප්‍රතිරාව වේ. අපගේ උරුමට මේ රට තුල ස්ථාපිත කිරීමට ඇයගෙන් වුන සේවය මතුවටත් සුරැකීමට අධිෂ්ඨාන කර ගැනීම මෙම මෑණිවරුනට පිදිය හැකි ලොකුම ගෞරවය ලෙස අපි විශ්වාස කරමු.

මෑණිවරුනි ඔබට නිවන් සුව අත්වේවා !!!

රංගන සහ උදුම්බරා රත්නතුංග
(රංගන - උදුම්බරා නර්තන කණ්ඩායම වෙනුවෙන්)


සන්නස

**උණුසුම් වසර පහක්**

2010 අප්‍රේල් මාසයට සන්නස ට වසර පහක් සපිරෙයි



**ඒ වෙනුවෙන් එවන ඔබේ ලිපි මාර්තු 25 වන දිනට පෙර ලැබෙන්නට සළස්වන්න**



**Do You Want To Migrate To Australia?**

**For All Your Australian Migration Visa Requirements**

- General Skilled Migration (onshore & offshore)
- Employer Nominations
- State Government Sponsorship
- Business Migration
- Family Visitor
- Spouse / De facto
- Graduate Skilled Visa Subclass 485/885 & 886
- Student Visa Extension
- MRT and RRT Appeals
- Skills Assessment

MIA
MEMBER OF MIGRATION INSTITUTE - OF AUSTRALIA -
MRAN 0958576

**We provide professional and cost effective service to our clients.**
**Step by step assistance and guidance until the end.**

**Ananda Kumarasiri**
**Australian Migration Consultant**
Dip. Marketing
Grd. Cert. Imm. Law -VU
MIB (Inr.Trade) –DU

**Contact Details:**
No 1 Heathcote Court,Endeavour Hills,Vic 3802,Australia.
Tele/Fax +61 3 9708 1168 Mobile +61 4 2585 1577

No 88, Diyawanna Garden,Battaramulla,Sri Lanaka.
Tele/Fax +94 112 787 645 Mobile +94 773 249 923
anandakumarasiri1@gmail.com



**Professional dedication to make your dreams become a reality.**

MASS Design - Sri Lanka. www.massadvertising.net / www.mass.lk / admass@sltnet.lk